# Project 36
# 36 වෙනි ව්‍යාපෘතිය

DP EDUCATION

Coding School




LIVEWORKSHEETS

Homework project 36 – 36 වෙනි ව්‍යාපෘතියට ගෙදර වැඩක්

පොත් රාක්කයේ පොත් පිළිවෙලට තියමු.

- ❖ ඔබට අවශ්‍ය පසුබිම සහ මූලික දෑ (විවිධ වර්ගයේ පොත්) සපයා ඇත. නමුත් එම පොත් ඒවාට අදාල කොටසේ පිළිවෙලට තබා නොමැත.




- ❖ ඔබට මෙම පොත් අදාළ රාක්කයේ තැබීමට පහතින් පෙන්වා ඇති ආකාරයට කරන්න.
- ❖ සිංහල කතා පොත් කොටසේ ඇත්තේ ළමා පත්තර බව ඔබට පේනවා ඇති.



(ළමා පත්තර)

- ❖ එම රාක්ක කොටසට ළමා කතන්දර පොත් ගබඩා කිරීමට ඒවාගේ position එක වෙනස් කිරීමට සිදු වේ.
- ❖ මේ සඳහා මුලින්ම design tab එකට යන්න. ඉන්පසුව ළමා කතන්දර පොත් මත click කරන්න.



(ළමා කතන්දර)

LIVEWORKSHEETS

❖ ඉන්පසු එහි properties වන x position හා y position වල අගයන් පහත පරිදි වෙනස් කරන්න.




x position - 0
y position – 0
එවිට ළමා කතා පොත් ඒවාට අදාළ රාක්කය වෙත පැමිණේවි.

❖ ළමා කතා පොත් රාක්ක කොටසේ තිබූ ළමා පත්තර එයට අදාළ රාක්කයේ ඇසිරීමට ළමා පත්තර මත Click කර ඉහත පරිදිම properties වෙනස් කරන්න.

x position - 195
y position – 145
එවිට ළමා පත්තර ඒවාට අදාළ රාක්කය වෙත පැමිණේවි.


❖ ඉංග්‍රීසි කතා පොත් රාක්කයේ ඇත්තේ ළමා කවි පොත් බව ඔබට පෙනෙනවා ඇති. ඒවා කවි පොත් රාක්කයේ ඇසිරීමට ඉහත පරිදිම කවිපොත් මත click කර එහි x position y positions properties වෙනස් කරන්න.



x position - 160
y position – 300
එවිට ළමා කවි පොත් ඒවාට අදාළ රාක්කය වෙත පැමිණේවි.

(ළමා කවි පොත්)

❖ ඉංග්‍රීසි කතා පොත් ඒවාට අදාල රාක්කය මත ඇසිරීමට ඒවා මත click කර එවාගේ properties වෙත ගොස් ඉහත පරිදිම position වෙනස් කරන්න.




x position - 185
y position – 0
එවිට ඉංග්‍රීසි කතා පොත් ඒවාට අදාළ රාක්කය වෙත පැමිණේවි.

(ඉංග්‍රීසි කතා පොත්)

❖ දැන් අපි ශබ්දකෝෂ පොත් ඒවාට අදාළ රාක්කයේ අසුරමු. ඒ සඳහා ඒවා මත click කර ඉහත පරිදිම properties වෙනස් කළ යුතු වේ. ඒ සඳහා අගයන් පහත පරිදි වේ.





x position - 20
y position – 310
එවිට ශබ්දකෝෂ ඒවාට අදාළ රාක්කය වෙත පැමිණේවි.

(ශබ්දකෝෂ)

LIVEWORKSHEETS

❖ අවසාන වශයෙන් සිතියම් පොත ඒවා තැබිය යුතු රාක්ක කොටසේ ඇසිරීමට සිතියම් පොත මත click කර එවාගේ properties පහත අගයන්ගෙන් වෙනස් කරන්න.



(සිතියම් පොත)

x position - 40
y position – 140
එවිට ශබ්දකෝෂ ඒවාට අදාළ රාක්කය වෙත පැමිණේවි.

නිවැරදි පිළිතුර තෝරන්න.

1. ඔබට යම්කිසි පොතක් වම් පසට හෝ දකුණු පසට කිරීමට අවශ්‍ය නම් ඔබ විසින් වෙනස් කළ යුතු වන්නෙ,

   X position හි අගය යි.

   y position හි අගය යි.

2. එසේ වෙනස් කිරීමේදී ඔබට එම පොත දකුණු පසට කිරීමට නම් ඔබ ඉහත තෝරාගත් property එකේ අගය,

   අඩුකළ යුතුය.

   වැඩිකළ යුතුය.

3. ඔබට යම්කිසි පොතකට අදාළ රූපයේ විශාලත්වය වෙනස් කිරීමට අවශ්‍ය යැයි සිතමු. ඒ සඳහා ඔබ භාවිතා කල යුතු වන්නෙ කුමන properties ද?

   X position, y position

   Width, height

LIVEWORKSHEETS